රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක: 23/89

(23)

රාජ්‍ය පරිපාලන , පළාත් සභා හා
ස්වදේශ කටයුතු අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ - 7.
1989 මාර්තු මස 23 වැනි දින.

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන් සහ
දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙත.

කනිෂ්ඨ සේවකයින් සඳහා නිවාඩු -- ආයතන සංග්‍රහය
XII වැනි පරිච්ඡේදය.

කරුණාකර 26 වැනි වගන්තියෙහි පහත සඳහන් උප වගන්ති මෙහි දැක්වෙන පරිදි සංශෝධනය කරන්න.

26:1:3 - සේවයේ මුල් මාස 9 තුල කනිෂ්ඨ සේවකයෙකුට ලබා ගැනීමට හිමිකම් ඇත්තේ 26:1 වැනි උප වගන්තියේ සඳහන් අසනීප නිවාඩු ප්‍රමාණයෙන් ඔහුගේ සේවයත්, මාස 9 ත් අතර ඇති අනුපාතයට අනුව ලැබෙන නිවාඩු කොටස පමණි.

26:2 - කනිෂ්ඨ සේවකයෙකුට 9:1 උප වගන්තියෙහි සඳහන් කොටස යටතේ හදිසි අනතුරු නිවාඩු දිය හැකිය.

26:2:1 - කපා හරින්න.

26:2:2 - කපා හරින්න.

26:3 - සිය රාජකාරි කටයුතු නියම වගයෙන් ඉටු කිරීමේදී යම් රෝගයක් වැළදෙන කනිෂ්ඨ සේවකයෙකුට 9:2 උප වගන්තියෙහි සඳහන් කොන්දේසි අනුව විශේෂ නිවාඩු දිය හැකිය.

26:4:1 - අසනීප සඳහා සාමාන්‍යයෙන් අඩියම් නිවාඩු නොදිය යුතුය. එහෙත්, 26:1 සිට 26:1:3 දක්වා වූ උප වගන්ති යටතේ ලබා ගත හැකි අසනීප නිවාඩු සම්පූර්ණයෙන් ලබාගෙන ඇති සේවකයෙකු සම්බන්ධයෙන් දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අභිමතය පරිදි මෙම නියමය ලිහිල් කළ හැකිය.

එවැනි අයට එකී උප වගන්තිය යටතේ දෙන අසනීප නිවාඩු සමගම ඊට පසුව අඩියම් නිවාඩු දිය හැකිය.

(සිරිල් ගමගේ)
ලේකම්,
රාජ්‍ය පරිපාලන, පළාත් සභා හා
ස්වදේශ කටයුතු අමාත්‍යාංශය.